# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2061/30 – 2018 මාර්තු 07 වැනි බදාදා – 2018.03.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/38/2012.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2015.12.29 වැනි දින අංක 1947/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2015.12.16 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ටී.එච්.ධර්මසේන මයා, "හේවා වාස", මහගම, (කළුතර හරහා).

02. ඩබ්.ඒ.වික්‍රමසිංහ මයා, නො. 56, තල්වත්ත, ගෝනවල (බ.ප.).

03. පී.එම්.ජී.බී. සේනානායක මයා, නාපාන, ගුන්නෑපාන.

04. ඒ.ඩබ්.ඩබ්. අබේසිරිවර්ධන මිය, "අතාවුද ගාඩ්න්ස්", ගඩලාදෙනිය පාර, පිලිමතලාව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ඉතිරි කිරීමේ බැංකුව, නො. 255, ගාලු පාර, කොළඹ 03.

අතර පවත්නා 2015.12.09 වැනි දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ටී.ඊ. සාන්තරාජන් මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු, වෘත්තීය සමිති සබඳතා සහ සබරගමුව සංවර්ධන අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2015.12.16 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා සහ සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2018 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

03-849/1

---

මගේ අංකය: IR/10/38/2012.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ටී.එච්.ධර්මසේන මයා, "හේවා වාස", මහගම, (කළුතර හරහා).

02. ඩබ්.ඒ.වික්‍රමසිංහ මයා, නො. 56, තල්වත්ත, ගෝනවල (බ.ප.).

03. පී.එම්.ජී.බී. සේනානායක මයා, නාපාන, ගුන්නෑපාන.

04. ඒ.ඩබ්.ඩබ්. අබේසිරිවර්ධන මිය, "අතාවුද ගාඩ්න්ස්", ගඩලාදෙනිය පාර, පිළිමතලාව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ඉතිරි කිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03.

අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා සහ සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, දිවුලපිටිය, මාපලන්ගෙදර, අංක 160 හි, කේ.එම්. සරත්චන්ද්‍ර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු, වෘත්තීය සමිති සබඳතා සහ සබරගමුව සංවර්ධන අමාත්‍ය.

2018 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/38/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ටී.එච්.ධර්මසේන මයා, "හේවා වාස", මහගම, (කළුතර හරහා).

02. ඩබ්.ඒ.වික්‍රමසිංහ මයා, අංක. 56, තල්වත්ත, ගෝනවල (බ.ප.).

03. පී.එම්.ජී.බී. සේනානායක මයා, නාපාන, ගුන්නෑපාන.

04. ඒ.ඩබ්.ඩබ්. අබේසිරිවර්ධන මිය, "අතාවුද ගාඩින්ස්", ගඩලාදෙනිය පාර, පිළිමතලාව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ඉතිරි කිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''1988.01.01 දින වන විට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ IV වන ශ්‍රේණියේ නිලධාරින් ලෙස සේවය කර ඇති, පහත නම් සඳහන් සේවකයින් 04 දෙනා විසින් 1988.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි III ශ්‍රේණියේ III පන්තිය ලබා ගැනීමටත්, ඒ හා සමගාමී ශ්‍රේණියන්හි පිහිටුවීමටත්, ඉන් අනතුරුව ලැබිය යුතු ඉදිරි තනතුරු හා ශ්‍රේණි ලබාගැනීම වෙනුවෙනුත් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත ද? එසේ යුක්ති සහගත වන්නේ නම් ඔවුනට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.''

01. ටී.එච්. ධර්මසේන මයා
02. ඩබ්.ඒ. වික්‍රමසිංහ මයා
03. පී.එම්.ජී.බී. සේනානායක මයා
04. ඒ.ඩබ්.ඩබ්. අබේසිරිවර්ධන මිය.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජනවාරි මස 17 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03-849/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.